**ශීර්ෂය 297 - සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කල මතය

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජනවාරි 13 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.6.1 **මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මාර්තු 21 සිට ඔක්තෝබර් 15 දක්වා මාර්ගගත ක්‍රමයට රැස්කල රු.6,621,000 ක් වූ සමිති ආදායම සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ගාස්තු ආදායම වශයෙන් හඳුනා ගැනීම හේතුවෙන්, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත ප්‍රේෂණය කල යුතු ආදායම රු.1,103,500 ක් අඩුවෙන් ප්‍රේෂණය කර තිබුණි. එම නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ බදුනොවන ආදායම් හා ලැබීම් රු.1,103,500 කින් වැඩිපුර පෙන්නුම් කර තිබුණි. | භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත ප්‍රේෂණය කළ යුතු ආදායම් නිවැරදිව ගණනය කළ යුතුය. | භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත බැර කරන ලද සමිති ආදායමෙන් හරි අඩ වැරදීමකින් හිලව් කරගෙන ඇති බැවින් එය 2020 ජුනි මස ආදායමින් නිවැරදි කිරීමට කටයුතු කරන බව |

**1.6.2 මුදල් ප්‍රවාහා ප්‍රකාශය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරනු ලැබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල රු.445,685 ක අත්තිකාරම් අයකර ගැනීම් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවද එම මුදල මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. තවද රු.8,600,000 ක්වූ අත්තිකාරම් ගෙවීම්ද ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වනු වෙනුවට මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් ප්‍රමිත අංක 02 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කළ යුතුය. | 2020 ගිණුම් සකස් කිරීමේදී ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්වීමට සටහන් කර ගතිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ආදායම් සංකේත අංක - 20.03.02.10** | | |
| (i) 2007 අංක 07 දරන සමාගම් පනතේ 131(1) සහ (2) වගන්ති ප්‍රකාරව ලියාපදිංචි සමාගම් විසින් ඉදිරිපත් කළ යුතු වාර්ෂික වාර්තා සඳහා අයවිය යුතු ආදායමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ඒකාබද්ධ අරමුදලට හිඟහිටි ආදායම රු.764,002,000 කි. තවද සමාලෝචිත වර්ෂය ආරම්භ වන විට හිඟව තිබූ රු.658,200,000 ක් වූ හිඟ ආදායමින් වර්ෂය තුලදී අයකර ගෙන ඇති ආදායම රු.35,064,000 ක් පමණක් විය. මුදල් රෙගුලාසි 128 (2) (ඉ) ප්‍රකාරව රජයට ලැබිය යුතුව පවතින මෙම හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම ගණන් දීමේ නිලධාරීගේ යුතුකම හා වගකීම වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | හිඟ හිටි ආදායම ඉක්මනින් අයකර ගැනීමට ක්‍රමවේදයන් සකස් කළ යුතුය. | වාර්ෂික වාර්තා ගොනු කරවා ගැනිමේ කාර්යයෙහි නිලධාරින් යොදවා හිඟ ආදායම් අය කරගැනිමට කටයුතු ඉටු කරමින් පවතින අතර දැනට මාර්ගස්ථ ක්‍රමය යටතේ සමාගම් ලියාපදිංචි කිරිම ආරම්භ කර ඇති බැවින් අලුතින් සංස්ථාපනය වන සමාගම් වලින් නියමිත පරිදි වාර්ෂික වාර්තා ගොනු කරවා ගැනිමේ හැකියාව පවතී. |
| (ii) සමාගම් පනතේ 170(1) වගන්තියට අනුකූලව සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය වාර්තා ලියාපදිංචි කළ යුතු සමාගම් සංඛ්‍යාව 6,893 ක් වුවද මූල්‍ය වාර්තා ලියාපදිංචි කර තිබූ සමාගම් සංඛ්‍යාව 1922ක් විය. ඉන් ලැබී තිබුණු මුළු ආදායම රු.3,844,000 ක් වූ අතර ඒකාබද්ධ අරමුදලට බැර කර තිබූ ප්‍රමාණය රු.1,281,333 ක් පමණක් විය. සමාගම් පනතේ ඉහත වගන්තිය ප්‍රකාර මූල්‍ය වාර්තා ලියාපදිංචි කළ යුතු සමාගම් හඳුනාගෙන ඒවායේ මූල්‍ය වාර්තා ලියාපදිංචි කරවීමට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | පනතේ නියමයන්ට අනුව සමාගම් වල කටයුතු නියාමනය කිරීම සඳහා ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. | මූල්‍ය වාර්තා ගොනු කරන ලෙස දන්වා සමාගම් වලට හා එහි අධ්‍යක්ෂරුන්ට ලිපි මඟින් දැන්වීමට ක්‍රියාමාර්ග ගෙන ඇති අතර දැනට මාර්ගස්ථ ක්‍රමය යටතේ සමාගම් ලියාපදිංචි කිරිම ආරම්භ කර ඇති බැවින් එම සමාගම් වලින් නියමිත පරිදි මූල්‍ය වාර්තා ගොනු කරවා ගැනිමේ හැකියාව පවතී. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2005 අංක 11 දරන සමිති ආඥා පනත (සංශෝධන) යටතේ ලියාපදිංචි සමිති විසින් වාර්ෂික වාර්තා ගොනු කළ යුතු අතර සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලියාපදිංචි කර ඇති මුළු සමිති සංඛ්‍යාව 16,042 කි. මින් සමාලෝචිත වර්ෂය තුල ලියාපදිංචි සමිති සංඛ්‍යාව 2452 ක් වන අතර නාමය කපා හැර ඇති සමිති සංඛ්‍යාව 191 කි. සමාලෝචිත වර්ෂය තුලදී සමිති 13,399 කින් වාර්ෂික වාර්තා ගොනු කර තිබුණේ සමිති 129 ක් පමණි. ඒ අනුව වාර්ෂික වාර්තා ගොනු කිරීමෙන් සමාලෝචිත වසරට අදාලව රු.13,399,000 ක් අයවිය යුතුව තිබූ නමුත් අයවී තිබුණේ රු.129,000 ක මුදලක් පමණි. | 2005 අංක 11 දරන සමිති ආඥා පනත (සංශෝධන) පනත අනුව කටයුතු කළ යුතුය. | ලියාපදිංචි සමිතිවලින් බොහෝමයක් සමිති ක්‍රියාකාරී නොවන සමිති වන බැවින්, ක්‍රියාකාරී සමිති හදුනාගැනීමට වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වේ. ඉන් පසු එම සමිති වල වාර්ෂික වාර්තා ගොනු කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත හැකිය. සමාගම් ලියාපදිංචි කිරිම පරිගණකගත කිරීමේ ක්‍රියාවලිය දැනට ආරම්භ කර ඇති බැවින් ලියාපදිංචි සමිති වලින් නිසියාකාරව වාර්ෂික වාර්තා ගොනු කර ගත හැකි අතර එම ආදයම හිඟ ආදායම ගණනය කිරිම සඳහා ද අදාල කර ගැනිමට ක්‍රියාමාර්ග ගත හැකි වේ. |

**(ආ) ආදායම් සංකේත අංක 10.03.07.08**

-----------------------------------------

| | | | |
|---|---|---|---|
| (i) | 2018 නොවැම්බර් 02 දින ප්‍රකාශිත 2018 අංක 35 දරන මුදල් පනතේ IX කොටසින් 2018 නොවැම්බර් මස සිට වාර්ෂික සමාගම් අයබද්ද එකතු කිරීම නැවතත් ආරම්භ කරන ලද අතර, පෙර අයකරන ලද ගාස්තුද සංශෝධනය කරන ලදී. මෙම ගාස්තු සංශෝධනය හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට, ඉකුත් වර්ෂයන්හි කරන ලද ගෙවීම් වලට අනුව පුද්ගලික සමාගම් 15,630 කින් රු.468,900,000 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. ලැයිස්තුගත පොදු සමාගම් 184 කින් රු.184,000,000 ක් අඩුවෙන් අයවී තිබුණු අතර විදේශීය සමාගම් ඇතුළු වෙනත් සමාගම් 795 කින් රු.119,250,000 ක් අයවිය යුතුව තිබුණි. ඒ අනුව වැඩිපුර මුදල් ගෙවූ, අඩුවෙන් මුදල් ගෙවූ සහ බදු මුදල් නොගෙවූ සමාගම් නිසි පරිදි හඳුනාගෙන ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | සංශෝධිත ගාස්තු අයකර ගැනීම හා වැඩිපුර ලබාගෙන ඇති මුදල් වලට අදාල ක්‍රියාමාර්ග ගත යුතුව ඇත. | 2016/ 2017 වර්ෂ වලදී ලියාපදිංචි කිරීමේ බදු මුදල් ගෙවා ඇති පුද්ගලික සමාගම්, ලැයිස්තු ගත පොදු සමාගම් හා විදේශීය සමාගම් ඇතුළු වෙනත් සමාගම් වෙන් වෙන්ව හඳුනා ගෙන ඇති බව හා මුදල් නොගෙවන ලද සමාගම් වලට අදාල ක්‍රියාමාර්ග ගැනීමට ඉදිරියේදී අයබද්ද අවසන් කළ පසු සිදුවනු ඇත. |

| | | | |
|---|---|---|---|
| (ii) | දෙපාර්තමේන්තුවෙන් ලද තොරතුරු වලට අනුව 2016 වර්ෂයට පෙර ලියාපදිංචි කරන ලද සමාගම් 71,802 කින් බදු මුදල් අයවිය යුතු බව දක්වා තිබුණු අතර ඉන් සමාගම් 17,486 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවීම් කර තිබුණි. ඒ අනුව තවදුරටත් සමාගම් 54,316 කින් මෙම බදු මුදල අයවිය යුතුව තිබුණි. | ගැසට් නිවේදනය පරිදි ගාස්තු අයකර ගත යුතුව ඇත. | යාවත්කාලීන කරන ලද දත්ත පද්ධතිය අනුව 2016 ජනවාරි 01 දිනට පෙර ලියාපදිංචි සමාගම් සංඛ්‍යාව 50,131 වන අතර එම සමාගම් අතර 2019 දෙසැම්බර් 30 දින වන විට බදු ගෙවිය යුතු සමාගම් සංඛ්‍යාව 32,642 ක් පමණක් වේ. |

**2.2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|

| | | |
|---|---|---|
| 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3(අ) සහ 4 ඡේද ප්‍රකාරව කටයුතු කිරීමකින් තොරව වසර 19 ඉක්ම වූ රු.120,741 ක ණය ශේෂ 03 ක් මේ දක්වාම ගිණුම් වල ඉදිරියට ගෙනැවිත් තිබුණු බව නිරීක්ෂණය විය. තවද මෙම ගිණුම් ශේෂ නිරවුල් කර ගන්නා බවට දැනට වසර ගණනාවක සිට දැනුම් දී තිබුණද මේ දක්වාම මෙම ණයශේෂ නිරවුල් කරගැන්මට කටයුතු කර නොතිබුණි. | 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3(අ) සහ 4 ඡේද ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මෙම ණය ශේෂයන් නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා සිටිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වසර අවසානයේ ලියාපදිංචි සමාගම් පිළිබඳ දත්ත ගබඩාවක් පිහිටුවීමේ අරමුණින් රු.4,617,505 ක වැය බරක් දරමින් සිදු කළ ව්‍යාපෘතිය මගින් 2018 දෙසැම්බර් 31 දිනට මුළු ලියාපදිංචි සමාගම් සංඛ්‍යාව 93618 ක් වූ අතර එයින් සමාගම් 22687 ක් අක්‍රීය වශයෙන් හඳුනාගෙන තිබුණි. නමුත් 2019 වසරේ කාර්යසාධන වාර්තාව තුළ 2018 දෙසැම්බර් 31 දිනට මුළු ලියාපදිංචි සමාගම් 84478 ක් හා 2019 වසර තුල නව ලියාපදිංචි සමාගම් 11363 ද ඇතුළුව මුළු ලියාපදිංචි සමාගම් සංඛ්‍යාව 95841 ක් වශයෙන් ගණනය කර තිබුණි. සංඛ්‍යා ලේඛණ අංශයේ, ආයතන අංශයේ හා ගිණුම් අංශයේ තොරතුරු වල මෙම පරස්පරතාවය හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සත්‍ය ක්‍රියාකාරී සමාගම් සංඛ්‍යාව මෙන්ම එදිනට ගණනය කරන ලද හිඟ ආදායමේද නිරවද්‍යතාවය තහවුරු කර ගත නොහැකි විය. | සත්‍ය ක්‍රියාකාරී සමාගම් සංඛ්‍යාව හඳුනා ගත යුතුය. | 2019 කාර්යසාධන වාර්තාවට මාර්ගස්ථ ක්‍රමය යටතේ ලියාපදිංචි සමාගම් සංඛ්‍යාවක් පිළිඹිබු වෙන බැවින් දත්ත පද්ධතියේ ඇතුළත් ලිපිගොනු සමඟ සමාන වීමක්ද සිදු නොවුණි. |

**4. මානව සම්පත් කළමනාකරණය**

සමාලෝචිත වර්ෂය අවසානයට දෙපාර්තමේන්තුවේ අනුමත, තත්‍ය හා පුරප්පාඩු සේවක සංඛ්‍යාව පිළිවෙලින් 156 ක්, 126 ක්, හා 30 ක් විය.
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| අ) | සමාගම් රෙජිස්ට්‍රාර් I ශ්‍රේණියේ තනතුරු දෙකක් සේවා ව්‍යවස්ථාව තුල අනුමතව පවතින අතර එම තනතුරු දෙක පුරප්පාඩුව පවතින බැවින් ඒ සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් II ශ්‍රේණියේ නිලධාරීන් දෙදෙනෙකු රාජකාරී ඉටු කිරීමේ පදනමින් 2015 ජූලි 01 දින හා 2016 නොවැම්බර් 07 දින සිට මේ දක්වාම පත් කර තිබුණි. මේ අනුව දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පවතින මෙම තනතුරු දෙක සඳහා නිශ්චිතව නිලධාරීන් බඳවා ගෙන නොතිබීම මත, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුර පුරප්පාඩු වන 2021 ජනවාරි 02 දිනට එම තනතුරට පත් කළ හැකි නිලධාරියෙකු දෙපාර්තමේන්තුව තුළ සුදුසුකම් සපුරා නොතිබුණි. | අත්‍යාවශ්‍ය කාර්ය මණ්ඩල පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. | රාජකාරී ඉටු කිරීමේ පදනමින් පත්කළ නිළධාරිනියන් දෙදෙනා පළමු ශ්‍රේණියට උසස් කර ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමඟ ලිපි හුවමාරු කෙරෙමින් පවතී. |
| ආ) | සමාගම් පරීක්ෂක තනතුරු 10 ක් වසර ගණනාවක සිට අනුමතව පවතින නමුත් එම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. මෙම තත්වය, ලියාපදිංචි සමාගම් නියාමනය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ පවතින ගැටළුකාරී තත්වයට සෘජුවම බලපා ඇති සාධකයක් බව නිරීක්ෂණය විය. තවද සහකාර අධ්‍යක්ෂ (පාලන) තනතුර හා නීති නිලධාරී තනතුරද පුරප්පාඩුව පවතින අතර, පුස්තකාලයාධිපති, ගොඩනැගිලි ඕවර්සියර් යන තනතුරු 02 හා කාර්යාල සේවක සේවය තුලද පුරප්පාඩු 07 ක් පැවතුණි. | අත්‍යාවශ්‍ය තනතුරු සඳහා කාර්ය මණ්ඩල පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. | සමාගම් පරීක්ෂක තනතුරු සඳහා විවෘත ක්‍රමයට බඳවා ගැනීමේ විභාග ප්‍රතිඵල ලැබී ඇති අතර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් මත බඳවා ගැනීම් සිදු කිරීමට නියමිතය. අනෙකුත් පුරප්පාඩු සඳහාද බඳවා ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී. |